දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
# அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்
# OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**

මගේ අංකය / எனது இல. / My No.: PSC/EST/4/1/12/2/2013
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2020.02.06

ලේකම්

ආරක්ෂක අමාත්‍යාංශය

**<u>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම</u>**

උක්ත කරුණ හා බැඳේ.

02. 2014.05.09 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද හා 2014.12.08 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සහතික කරන ලද උක්ත බඳවා ගැනීමේ පටිපාටියට ඇමුණුමේ 01 හි සඳහන් සංශෝධනයන් එක් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020.01.28 වන දින අනුමත කර ඇති බව, එම කොමිෂන් සභාවේ තීරණය පරිදි කාරුණිකව දන්වා සිටිමි.

03. ඒ අනුව, බඳවා ගැනීමේ පටිපාටියට ඇතුළත් කරන ලද සංශෝධනයන් පිළිබඳ අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, එම සංශෝධන වෙබ් අඩවියේ පළ කරන ලෙසත් වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

අත්.කළේ/- ආර්.ඩී.පී.එස්.ධර්මසේන
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන)
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ
ලේකම්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස
2. ලේකම්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස
3. කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව- අ.ක.ස
4. ආයතන අධ්‍යක්ෂ ජනරාල්- කරු.දැ.ගැ.ස

සංශෝධන ලැයිස්තුව | ඇමුණුම 01

<table>
<tr><th>අනු අංකය</th><th>ඡේද අංකය</th><th>සංශෝධන විය යුතු ආකාරය</th></tr>
<tr><td>1.</td><td>1.6</td><td>යොමු අංකය :PSC/EST/4/1/12/2/2013 දිනය: 2014.05.09<br><br>01 වන සංශෝධිත දිනය :......................<br>(දිනය සඳහන් කරන්න)</td></tr>
<tr><td>2.</td><td>11.1 හි 02 වන තීරුවෙහි 02 වන පේළිය</td><td>
<table>
<tr><th>ආයතනය</th><th>තනතුර</th><th>දැනට පවතින ආකාරය</th><th>සංශෝධනය විය යුතු ආකාරය</th></tr>
<tr><td>කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව</td><td>1. ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ</td><td>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම</td><td>ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ හෝ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු වීම<br><br>සටහන: විශේෂ ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරියකු සඳහා විශේෂ ශ්‍රේණියේ තනතුරක් නොමැති වූ අවස්ථාවකදී මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.</td></tr>
</table>
</td></tr>
</table>